# පහන් සිතින් දෙන පිණ්ඩපාත දානය කල්ප ගණනක් සුගතිගාමී කර නිවන් දකින තෙක් ම විපාක ගෙන දෙයි

## ඒකාසනදායක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදාන පාළි 1 - පිටු අංක 396 - 397)

පදුමුත්තර බුදු රජාණන් වහන්සේගේ සසුනේ භික්ෂූන් වහන්සේ නමකට පහන් සිතින් පිණ්ඩපාත දානයක් දුන් කෙනෙකුට ලැබුණේ මහත් ආනිසංසයකි. එතැන් සිට කල්ප ලක්ෂයක් ම ඔහු ඉපදුණේ සුගතියේ ම යි. පසු කලෙක ඔහු අප බුදු රජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි ව මහ රහත් බව ලබා පිරිනිවන් පා වදාළහ.